සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

අනේ සිංහල

මා කියවන කවර ලියවිල්ලක උවද වියරන දොස-ක් දකින විට සිතේ කැලඹීමක් ඇති වන්නේ ඇය් දැය් මම නොදනිමි. සමහර විට තිස්පස් වසරක් (5-12) සිසු දරුවන්ට නිවැරදි සිංහල උගන්වන්නට තැනූ (තැතනූ) ගුරුකු නිසා විය හැකි ය.

දෙසැම්බර් සන්නසේ පළවූ "ධර්මය සහ යථාර්ථය" කියවීමෙන් මා ලැබුවේ ඉමහත් තෘප්තියකි. ඒ ලිපියේ වියරන දොසක් ගැන හෝ යතුරු ලියමනේ දොසක් ගැන හෝ මගේ සිත යොමු නොවූයේ මා ඒ ලිපියට වසී වූ නිසා විය හැකිය. එහි දෙවන ලිපිය පලවන තෙක් මම ඇඟිලි ගනිමින් සිටිමි.

ඊලගට මගේ නෙත ගැටුනේ "සිංහලයෝ හෙවත් හෙළයෝ නම් කවරහු ද" යන ලිපියයි. අලුත් සොයා ගැනීමක් හෝ අලුත් මතයක් ද යන සැකය නිසා මම එය ද කියවීමි. මා හතර වැනි පන්තියේ දී කියවූ පොතක තිබි කතාවක් සුලු වෙනස් කම් කිහිපයක් ද සහිත ව එහි දක්වා තිබිනි.

මා අද න/ණ, ල/ළ, ශ/ෂ වෙනස නොසලකා මගේ ලියවිලිවල න/ල/ශ පමණක් ලියන බව සන්නස පාටකයෝ දනිති. ඉරිත්තක් (කුඩා ඉරක්) හෝ තිතක් මගින් අල්පප්‍රාන අක්ශරයක් මහාප්‍රාන අක්ශරයක් කර ගැනීමේ සම්මත ක්‍රමයක් තවමත් හඳාගෙන නැති නිසා මා ලියන අල්පප්‍රාන අක්ශර (අවශ්‍ය තැන්වලදී) මහාප්‍රාන අක්ශර ලෙස සලකා කියන ලෙස පාටකයන් ගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි. පුස්ථකාලය - වීරෝධාර - ශක්ථිය - දෘෂ්ඨිය - ආහාදය වැනි වචනත් විෂ්වාශය - මහේෂ්වර වැනි වචනත් දැක ඇති ඔබ, මා ලියන පාටකයා, විරුද්ද වැනි වචන දැක උදහස් නො-වනු ඇතැයි සිතමි.

අද න/ණ, ල/ළ, ශ/ෂ කෝලමක් හෙවත් විකාරයක් බවට පත් වී ඇත. කිසියම් බාසාවක " දෘෂ්ලානි" යනුවෙන් වචනයක් ඇතැයි සිතමු. එය ඉංගිරිසි බාසාවේ අකුරුවලින් ලියූ විට "DRSH-LANI" (ඩ්ර්ශ්ල්ආන්ඉ) නිවැරදිය. එහෙත් සිංහලෙන් දෘෂ්ලානි -දෘෂ්ලානි - දෘෂ්ලානි - දෘෂ්ලානි - දෘශ්ලානි - දෘශ්ලානී - දෘශ්ලානී - දෘෂ්ලානී ආදි වශයෙන් ලිවිය හැකි වුවත් අප එය කියවන්නේ ඩ්ර්ෂ්ලානී යනුවෙනි. තාලුජ සහ දන්තජ අකුරු අපට කියවෙන්නේ ඉතා කලාතුරකිනි. "ඩ්ර්ශ්ලානී" යන වචය මට නිවැරදිව කිව නොහැක්කේ ඒ නිසාය. දෘ, තෘ, බෘ - ද්රු, ත්රු, බ්රු යනුවෙන් නොව ද්ර්, ත්ර්, බ්ර් යනුවෙනි කියවිය යුත්තේ. දෘ, තෘ, බෘ - ද්රෘ, ත්රෘ, බ්රෘ යනුවෙන් කියවීම වැරදිය. ඒවා නිවැරදි ව කියවන්නේ ද්ර්ර්, ත්ර්ර්, බ්ර්ර් යනුවෙනි.

න/ණ, ල/ළ කෝලමට නිදසුන් ලෙස දෙසැම්බර් සන්නසේ "ධර්මය සහ යථාර්ථය" යන ලිපියේ ඇති "වල්පල" "ළබන" සහ "කළාපයේ" යන වචන තුන ගනිමු.

ගමකට "පල" එකතු වන්නේ "තැන" යන තේරුම දීමටයි. තොටුපල, හෝම්පල, කඩපල, සූදුපල යන තැන් තේරුම් ගන්න. කියවීමේ පහසුව නිසා පල - පොල (පළ/පොළ) වීමත්, දොල - දල (දොළ/දළ) වීමත් (කිරිවන්දළ - නාකන්දළ) දොර - දර වීමත් (ගිරිදර - ගන්දර - දෙවින්දර) සිදු වේ. පළ සහ දොළ ලියන්නේ මුර්දප් "ළ" යන්නෙනි.

වල් + අඳුර = වලඳුර, වල + ගම = වල්ගම, වල් + පිට = වල්පිට (පිටිය - පිට - විටිය - විට සමාන අරුත් ඇති පදයි) වල් + පල = වල්පල යන වචනවල ඇති "වල්" යන්න "කැලෑ" යන අරුත දේ.

එදා ගම්ගොඩවල් හෙවත් ගම්පලවල් තිබුනේ එකිනෙකට ඈතිනි. එහෙයින් බොහෝ තැන් කැලෑවෙන් වැසී- වල් බිහි වී තිබුනි. ඒ නිසා වලඳුර, වල්පිට, වල්ගම, වල්පල යන නම් ඇති වූ බව පෙනේ.

ළබන - කළාප යන පද දෙකේ මූර්දප් "ළ" කවර හේතුවක් නිසා එසේ වී දැයි නොදනිමි.

(සියල්ලෝ) සියළු, (කුරුල්ලෝ) කුරුළු, (ගොපල්ලෝ) ගොපළු, (ගැට ලු තැන්), ගැටළු (මහල්ලෝ) මහළු යන වචනත් කළමණාකරනය, කලමණාකරණය නිතර දකින මට න/ණ, ල/ළ කෝලමක් සේ පෙනේ.

"ධර්මය සහ යථාර්ථය" ඉතා කාලෝචිත ලිපියකි. පිදුරු පුන්නක්කුවලට ඇබ්බැහි කරන ලද (අන්ද බක්තියෙන් මත් වූවන්ට) අඳ -

බැතිමතුන්ට එබඳු ලිපි ගෝචර නොවන ප්‍රිය නොවන ඒවායි. ඒවා කියවූ විට ඔවින්ට තද වේ. එහි ඊලග කොටස කියවන්නට මම ඇඟිලි ගනිමින් සිටිමි.

දෙවනු ව මගේ නෙත ගැටුනේ "ගැහැනියක් - රෝදයක් - මිනිසෙක්" දැක්වෙන සිතියමටයි. "සිංහලයෝ හෙවත් හෙළයෝ (නම්) කවරහු ද ?" යන සිරස අනුව එය, කපු කටිමින් සිටියහ යි කියන කුවේනියගේත් විජයයාගේත් විය යුතුය. ලිපියේ කිසි තැනක ඒ ගැන සඳහනක් නැත.

ඇත්තට ම ඒ ලිපිය විශ්‍රාම ලත් පලපුරුදු ගුරුවරියක විසින් ලියන ලද්දක් ද? නැතහොත් හ-වැනි පන්තියේ ලමයෙකු එතුමියගේ නමට මුවා වී ලියන ලද්දක් ද? එය මම නොදනිමි.

ඒ ලිපිය කියවන විට මගේ සිතේ ඇති වූ කම්පාවත් කලකිරීමත් නිසා මේ ලිපිය ලියන්නට අදහස් කලෙමි. වැරැද්ද පෙන්වා දීමත්, හරිය (නිවැරැද්ද) නුවා දක්වීමත් ශිෂ්ට සමාජයේ සිරිතයි.

ඒ ලිපිය කැඩී 13 කට වෙන්කොට ඉන් එකින් එක ගැන මම මගේ අදහස් දක්වමි. ඒ ලිපිය ලියන ලද්දේ කවරකු විසින් උවත් ඔහුට/ඇයට රැදවීමේ අදහසක් --- නැති බව සැලකුව මනා ය. ඒ ලිපියේ අන්තර්ගතය හෝ ඖචිත්‍යය ගැන කිසිවක් නොක-ියමි.

1. කැඩිය: "වගු/රජතුමාට සුප්පාදේවි නමින් රූපශ්‍රීයෙන් අග තැන් පත් දියනියක් සිටියේ ය."
දියනියක්/දියණියක් දෙවිදියටම ඉතා නොසැලකිල්ලෙන් ලියා ඇති බව පෙනේ.
ආණ - (පියාණ, සිටාණ, කෙලඹියාණ)
අණු - (පුතණු, මුත්තණු, මය්ලණු)
අණී - (දියණී- දු + අණී = දුවණී = දියණී, නැගණී - නග + ඉනි - නැගණී, නැන්දණී - නැඳි + අණි - නැන්දණී)

යන පදවල තිබිය යුත්තේ මූර්දප් "ණ" යන්නයි. ඒ පද නිත්‍ය බහු වචන විය යුතුය. සිටාණෝ / සිටාණ කෙනෙක්, පුතණුවො"/ පුතණු කෙනෙක්, දියණියෝ දියණී කෙනෙක් යනුවෙනි එය නිවැරදි ව ලියන්නේ. සිටාණා / පියාණා, පුතණුවා / බෑනණුවා, දියණිය / නැගණිය වැනි යෙදුම් පස් වැන්නේ ලමයකුගේ ලියවිල්ලක ඇති විට එය නොසලකා හල හැක.

"දියනියක් සිටියේ ය/පුතනුවෙක් සිටියාය" වැනි වැකි ගැන කියන්නට දෙයක් නැත.

"ඇගේ ජන්ම පත්‍රයෙන් එළි දැක්වූයේ ඇය කෙදිනක හෝ මාලිගාව හැර යන බව ය"

ජන්ම පත්‍රයට "හඳහන" යන නම ව්‍යවහර වන්නේ කෙනෙකුගේ උපත ගැන විස්තර සඳහන් වී ඇති නිසා ය. පුවත් පතක් (හා හා පුරා කියා), පොතක්, රැඟුමක් එලි දක්වතත්, ජන්ම පත්‍රයකින් සිදු වන්නේ යමක් එලි දරව් වීමකි.

දුවක හෝ පුතකු ගෙදරට නාකි වීම කොතරම් අවාසනාවක් ද? දියණියක් දිග දීමට ගෙදරින් පිට කිරීමට දෙ මා පියෝ, කොතරම් වෙහෙසක් ද? "මින් ශෝකයට පත් මහ රජ යුවල දැඩි ආරක්ෂා සහිතව (ඇය) මතු මහල් තලයේ තැබුවා ය."

මේ වැකියේ උක්තය "මහ රජ යුවල" ය. කර්මයක් නැත. (එය කියවන්නා අතින් දමා ගත යුතු ය) ආඛ්‍යාතය "තැබුවාය" ස්ත්‍රී ලිංග නාම ක්‍රියාවකි. - අනේ කාලේ වනේ වාසේ -

කල්යාමේ දී සඳ රැස් දසත ගලා යන එක් රාත්‍රියක දී සිටු මැදුරු කවුළුවෙන් පිටත බලද්දී දර්ශණීය මනස්කාන්ත පරිසරයෙන් කුල්මත් වූවා ය." (උක්තයක් නැත. කවුදැයි සිතා ගැනීම අපට බාර ය) කලකට පසු සඳ රැස් දසත ගලා ගිය බව පෙනේ. (සතර අත - අටඅත - දස අත) දර්ශණීය සහ මනස්කාන්ත දෙකක් විය යුතු ය. දර්ශණීය - මුර්දප් වීම අරුමයකි. යමකු කුල්මත් වන්නේ පරිසරයෙන් නො වේ; පරිසරය දැකීමෙනි. උඩු මහලේ සිට එක් වර ම පාත මාලයට නොපිනූ බව කිම සඳහා "ක්‍රමක්‍රමයෙන්" යොදා ඇත. බට, බටුයේය, බැස්සේ යන පද තුනම ලියා ඇත. බැස්ස යනු බොලඳ වචනයකි. දර්ශනයෙන් කුල්මත් වූ ඇය ඒ දෙස බලා නො සිට (ලඟින් නොව) දුරින් ගමන් කල වෙලඳ කන්ඩායමකට එකතු වී ඇත. වෙලෙන්දෝ කිසි දු විමසීමක් නොකලේ ඇය ඔවින්ට වසන් වී ගිය නිසා ද

ඒ ගොඩිබ වෙලෙන්දන් එක මිනිසකු ට බිය වී ඒ මේ අත දිව යද්දී ඇය සිටි වනම සිට ඇත. ඇය තනි වූයේ වෙලඳුන් දිව යද්දී ද? වෙලඳුන් දිව ගිය නිසා ද? ගැල් කන්ඩායම ගෙන යමින් සිට ඇත්තේ පොට්ටනි දෙක තුනක් විය යුතු ය. (සොරාට පැහැර ගැනීමට - ගෙන යෑමට හැකි වූයේ ඒ නිසාය)

කෙල්ලක මහ රෑ ගෙදරින් පැන යන්නේ මනස්කාන්ත පරිසරය දැකීමෙන් කුල්මත් වූ නිසා යැයි කීම මනස්ගාතයකි. ඇය එසේ ගියේ කැසිල්ල - විසේ - ගාය නිසා ය.

කෙසේ වෙතත් වෙලෙන්දන් ශිශ්ධ, සිල්වත් පිරිසක් වූ නිසා ඇය නිරුපද්‍රතව ටික දුරක් හෝ ගිය බව පෙනේ.

ඊලග කොටස පසුවට.

මම මේ දිනවල එක්තරා ලේකකයෙකුගේ කෙටිකතා කිහිපයක් නිවරද කරමින් සිටිමි. එහි අඩුපාඩු ගැන කතා බහ කරන අතර මම මේ ලිපිය ඔහුට පෙන්වීමි. එය ඔහු ඕනෑකමින් කියවනු දුටිමි.

"මාත් සිංහල ඉගෙන ගත්තේ ඔය වගේ ටීචර් කෙනෙක්ගෙ - ඒකයි - තවමාත් - සන්සාරේ -"

ජ්‍යෝතිෂය ASTROLOGY

කේන්ද්‍රය අනුව පලාපල කථනය, නැකැත් සෑදීම කේන්ද්‍ර, ඇතුළු සියළු ජ්‍යෝතිෂ කටයුතු සඳහා විමසන්න.

දේවසිරි විද්‍යාරත්න (M.A)

90777523 - 0450303527